සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2009/2010 වර්ෂය සඳහා කොළඹ මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන් පළවේ.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,667 - 2010 අගෝස්තු මස 13 වැනි සිකුරාදා - 2010.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1436 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1437 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 20 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අගෝස්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1435- B 079893— 7,100 (2010/08)
F1-(S)

# ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසේ 32 (1) වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත් කිරීම්**

| | |
|---|---|
| 01 ඩී. එම්. කේ. සී. දිසානායක මහතා<br>ශ්‍රී.ලං.ප.සේ. III පන්තිය | 2010.06.01 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ, සහකාර ලේකම් තනතුරේ වැඩබැලීම සඳහා |
| 02 ඒ.ඩී. අමරසිරි මහතා<br>ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය | 2010.06.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා |
| 03 එච්. එම්. බී. පී. හේරත් මහතා<br>ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය | 2010.06.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ, ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් තනතුර සඳහා |
| 04 ඒ. ඒ. යූ. සකුන්තලා අදිකාරි මෙනවිය<br>ශ්‍රී.ලං.ප.සේ. III පන්තිය | 2010.06.30 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන වයඹ පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, ගොවිජන සංවර්ධන සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, සහකාර ලේකම් තනතුර සඳහා |
| 05 ජේ. එම්. ආර්. පී. ජයසිංහ මහතා<br>ශ්‍රී. ලං.ප.සේ. I පන්තිය | 2010.06.30 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල මහ නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස් තනතුර සඳහා |
| 06 ආර්. එම්. ආරියරත්න මහතා<br>ශ්‍රී. ලං.ක්‍ර.සේ. I පන්තිය | 2010.06.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැළසුම්) තනතුර සඳහා |
| 07 එච්. පී. එම්. එස්. බී. පතිරාජ මහතා<br>ශ්‍රී.ලං.ග. සේ. I පන්තිය | 2010.06.28 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ, ගණකාධිකාරි තනතුර සඳහා |
| 08 එච්. එම්. සිරිමෙවන් හේරත් මහතා<br>ශ්‍රී. ලං. කෘ.සේ. II/I පන්තිය | 2010.06.16 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 09 එන්. එච්.විමලරත්න මහතා<br>ශ්‍රී. ලං.කෘ.සේ. II/I පන්තිය | 2010.06.16 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තනතුර සඳහා |
| 10 ඩබ්ලිව්. එම්. එස්. වන්නිනායක මහතා<br>ශ්‍රී. ලං. කෘ.සේ. II/I පන්තිය | 2010.06.16 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගල්ගමුව කලාපීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ, කලාපීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 11 ඩී. ඒ. වනිගසේකර මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/I පන්තිය | 2010.05.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආර්. ඒ. තිලකරත්න,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2010 ජූලි මස 23 වැනි දින,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලය.

08-352

# පළාත් සභා නිවේදන

**පන්නල ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥාපනත

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පන්නල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ (2) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ වයඹ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී වගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

**යෝජනාව**

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළත්වීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයකට (10%) සමාන බද්දක් පනවා අය කළ යුතු යැයිද මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළ කරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළවැන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද යෝජනා කරන්නීය.

එසේ වුව ද මෙම යෝජනා සම්මත ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටයක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකළ යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් 7.5% ක් විය යුතුය.

අතුල සරත් කුමාර විජේසිංහ,<br>
ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,<br>
ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන, සම්බන්ධීකරණ,<br>
සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා<br>
බෙදාහැරීමේ අමාත්‍යාංශය - වයඹ පළාත.

2010 අප්‍රේල් මස 30 වැනි දින,<br>
වයඹ පළාත්, පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

08-228

---

**අයගම ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය / 126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,<br>
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,<br>
සබරගමුව පළාත.

2010 ජූනි මස 30 වැනි දින,<br>
සබරගමුව පළාතේ පළාත් සභාවේ දී ය.

**ප්‍රාදේශීය සභා බලසීමාව තුළ බදු අයකර ගැනීම පිළිබඳ අදාළ තොරතුරු හා වාර වාර්තා ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වෙළඳ වෘත්තීය හා කර්මාන්ත සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කර බද්දක්, කුලියක් හෝ වෙනයම් කුමන හෝ ගාස්තුවක් අය කිරීමට අදාළව තොරතුරු හා වාර්තා ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් අයකර ගත හැකි බද්දක්, කුලියක් හෝ වෙනයම් ගාස්තුවක් අයකර ගැනීම සඳහා අදාළ තොරතුරු හා වාර වාර්තා ලබා ගැනීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා පවත්වාගෙන යාම මෙ මගින් අපේක්ෂා කෙරේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන හෝ කොන්දේසි මෙම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට වලංගු වන්නේය.

(අ) මෙම අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි අංක 1 උපලේඛනයේ විස්තර වන ව්‍යාපාර, කර්මාන්ත සම්බන්ධයෙන් අදාළ වන්නේය.

4. 03 (අ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ප්‍රකාර තමා විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳ, කර්මාන්ත සම්බන්ධයෙන් අයගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යම්කිසි බද්දක්, කුලියක් හෝ වෙනයම් ඕනෑම ගාස්තුවක් අයකර ගැනීම සඳහා අවශ්‍ය වියහැකි යැයි හැඟෙන ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඉල්ලා සිටින ඕනෑම තොරතුරක් හෝ වාර්තාවක් ලබාදීමට ඉහත 3 (අ) ව්‍යවස්ථාවේ 01 වැනි උපලේඛනයේ සඳහන් වන වෙළඳ හා කර්මාන්තවල නියැලී සිටින සෑම තැනැත්තෙකුම බැඳී සිටින්නේය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු හා වාර්තා පිළිබඳ ලේකම්වරයා විසින් දැන්වීමක්, නිවේදනයක් හෝ වෙනත් විධිමත් දැනුම්දීමක් කර, එකී දැනුම් දීමේ දින සිට දින 30ක් ඇතුළත අයගම ප්‍රාදේශීය සභාව වෙත තැපෑලෙන්, ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීමට කටයුතු කළ යුතුය. අතින් ගෙනවිත් භාරදෙන සෑම ලියවිල්ලක්ම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට භාර දිය යුතු ද වන්නේය.

6. ඉහත වගන්තියේ ප්‍රකාර දින 30ක් තුළ සභාව වෙත ලබාදෙන තොරතුරු හා වාර්තා සම්බන්ධයෙන් ලියවිලි ලද බවට අයගම ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින්, කුවිතාන්සියකින් හෝ වෙනයම් ආකාරයකින් සනාථ කිරීම සභාවේ වගකීම වන්නේය.

7. උක්ත දින 30 තුළ අදාළ තොරතුරු නොලැබෙන්නේනම් එකී තොරතුරු සභාවට අවශ්‍ය වේ යැයි හැඟේ නම් සභාවේ සභාපතිතුමාගේ හෝ ලේකම්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුට අදාළ වෙළඳ, කර්මාන්ත වෙත ගොස් අදාළ තොරතුරු හෝ වාර්තා ලබා ගැනීමට ඉල්ලා සිටීමට හෝ පරීක්ෂා කිරීමට මෙම අතුරු ව්‍යවස්ථාව මගින් ඉඩකඩ සැලසෙන්නේය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව *ගැසට් පත්‍රයේ* පළ වූ දිනට පසුව ආරම්භ කරනු ලබන ව්‍යාපෘතියක් / කර්මාන්තයක් වූ විට එහි අයිතිකරු හෝ කළමණාකරු විසින් එසේ ආරම්භ කර දින 30 ක් ඉකුත්වීමට පෙර ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දිය යුතුය.

9. කිසියම් ස්ථානයක පවත්වාගෙන යනු ලැබූ ව්‍යාපාර/කර්මාන්තයන්හී වෙනසක් ඇතිවූවිට එකී වෙනස සිදුවී දින 30 ක් ඉකුත් වීමට පෙර ඒ බව එකී ස්ථාන අයිතිකරු හෝ කළමණාකරු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා වෙත දැනුම්දිය යුතුය.

10. එකම ස්ථානයක ව්‍යාපාර/කර්මාන්ත හා වෘත්තීන් කිහිපයක් පවත්වාගෙන යන්නේනම් අදාළ තොරතුරු 02 උපලේඛනයේ සඳහන් ආකෘතිය මගින් වෙන් වෙන් වශයෙන් සැපයීම අදාළ ව්‍යාපාර/කර්මාන්තකරුගේ වගකීම හා යුතුකම වන්නේය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් ඉල්ලා ඇති තොරතුරු හෝ වාර්තා නියමිත කාල වකවානු තුළ දී ලබාදීමට කටයුතු නොකිරීම, පැහැර හැරීම හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට රු.750කට නොවැඩි දඩයකින් ද වරදකරු කිරීමෙන් පසුව ද එම කඩකිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩකිරීම කෙරෙහි අවධානය යොමුකරමින් සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව ද එම වරද කරගෙන යන්නේනම් එසේ කරන සෑම දිනයක් සඳහාම දිනකට රු. 250ක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

12. *අර්ථ නිරූපනය* :

* පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ-

''සභාව'' යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාව ද,

''සභාපති'' යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ කටයුතු කරන අය ද,

* ''ලේකම්'' යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරයේ කටයුතු කරන අය ද,

* "බලය පැවරූ නිලධාරියෙකු" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද අදහස් වේ.

* මෙහිදී -

"පිරිවැටුම" යන්නෙන් කිසියම් වෙළඳ ව්‍යාපාරයක හෝ කර්මාන්තයක සියලු ලැබීම් අදහස් වේ,

* "ව්‍යාපාරය" යන්නෙන් යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය, සැපයීම හෝ අලෙවිය සිදුකරනු ලබන පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ ආයතනයක්

අදහස් වේ.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථය සම්බන්ධයෙන් යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල පිටපත වලංගුව බලපවත්වන්නේය.

### *අංක 1 උපලේඛනය*

* ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ හෝ හෝටල්, ආපන ශාලා හෝ නවාතැන්පොළවල්.

* ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් අනුමත කරන ලද විදුලි බලාගාර.

* කර්මාන්තශාලා.

* ඇඟලුම් කම්හල්.
* විදේශ රැකියා නියෝජිත ආයතන.
* සුපිරි වෙළඳසල්.
* ලියාපදිංචි මත්පැන් හල්.
* පෞද්ගලික ප්‍රවාහන සේවා ආයතන.
* රිය පැදවීම පුහුණු කරන ආයතන.
* මුදල් තැන්පත් කිරීම, ණයට දීම සිදු කරනු ලබන සියලුම මූල්‍ය ආයතන.
* රක්ෂණ ආයතන.
* විගණන ආයතන.
* පුද්ගලික වෛද්‍ය පරීක්ෂණාගාර.
* ස්වාධීන කොන්ත්‍රාත්කරු ආයතන.
* වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන්.
* මැණික් වෙළඳ ව්‍යාපාරිකයින්.
* කොන්ක්‍රීට් වැඩපලවල්.
* ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කර ඇති වෙනත් සියලුම ව්‍යාපාර.

*අංක 2 උපලේඛනය*

1. අයිතිකරුගේ නම :————————.

2. හැඳුනුම්පත් අංකය :————————.

3. ලිපිනය :————————.

4. ව්‍යාපාරික ස්ථානයේ වාර්ෂික වටිනාකම :————————.

   (i) තක්සේරු අංකය :————————.
   (ii) පසුගිය වාර්ෂික පිරිවැටුම/ලැබීම් :————————.

5. ව්‍යාපාරයේ/කර්මාන්තයේ/වෘත්තීයේ ස්වභාවය :————————.

6. ව්‍යාපාරය/කර්මාන්තය විසින් සපයනු ලබන හෝ නිපදවනු ලබන භාණ්ඩ (විස්තර පසුපිටේ සඳහන්ව ඇත.) :————————.

7. සේවයේ නියුතු සේවක සංඛ්‍යාව :————————.

8. ව්‍යාපාරය/කර්මාන්තය/වෘත්තීය වෙනත් දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් යටතේ ලියාපදිංචි වී ඇත්නම් විස්තර :————————.

9. වෙනත් :————————.

ඉහත ම විසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් අසත්‍යයෙන් තොර බවත් සහතික කරමි.

————————,
අත්සන.
(ව්‍යාපාරය/කර්මාන්තය/වෘත්තීය අයිතිකරු).

දිනය :————————.

08-229/2

**අයගම ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය /126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2010 ජුනි මස 30 වැනි දින,
සබරගමුව පළාතේ පළාත් සභාවේ දී ය.

**මහජන පුස්තකාල විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පුද්ගලයින්ගේ අධ්‍යාපනික සංවර්ධනය, කියවීමේ රුචිකත්වය දියුණු කිරීම, පුද්ගල විනය හා පෞරුෂ වර්ධනය කිරීම, විනෝදාත්මක හා නිර්මාණාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ වූ සම්පත් හා සේවා සැපයීම තුළින් මහජන පුස්තකාල සේවාව විධිමත් කර පාලනය කිරීමට අයගම ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

2. අයගම ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා පරිදි පහත සඳහන් අංශ කිහිපයකින් හෝ සියල්ලෙන් සමන්විත වන්නේ ය :–

   (i) බැහැර දෙන අංශය,
   (ii) විමර්ශන අංශය,
   (iii) ළමා අංශය,
   (iv) වාර සඟරා හා පුවත්පත් අංශය,
   (v) අධ්‍යයන අංශය,
   (vi) ග්‍රන්ථ සංරක්ෂණ අංශය,
   (vii) ජංගම හා ශාඛා පුස්තකාල,
   (viii) වෙනත් තොරතුරු සේවා.

3. අයගම ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයෙකු සිටිය යුතු අතර එසේ පත්කරනු ලබන තැනැත්තා මහජන පුස්තකාලයේ සංවිධානය හා කළමණාකාරීත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට වගකිව යුතු වන්නේ ය.

4. මහජන පුස්තකාලයේ අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා (මෙහි මින් මතු පුස්තකාල කමිටුව යනුවෙන් සඳහන් කරනු ලබන) පුස්තකාල උපදේශක කමිටුවක් වෙත පැවරෙන්නේය :–

   (i) මෙම කමිටුව ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව පත් කරනු ලැබේ. එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වනු ඇත :–
      * සභාවේ සභාපතිවරයා,
      * ප්‍රාදේශීය සභාවේ සභිකයින් අතරින් තෝරා ගනු ලබන තුන් දෙනෙකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවක්,
      * සභා බල ප්‍රදේශයේ පදිංචි ජනතාව අදහන ආගම් නියෝජනය වන ආකාරයට එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බැගින්,
      * ප්‍රාදේශීය සභාව විසින් තෝරා පත් කර ගනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි විශිෂ්ඨ තැනැත්තන් තුන්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්,
      * ප්‍රාදේශීය සභාවේ ලේකම්,
      * සභාවේ ප්‍රජා සම්බන්ධතා නිලධාරී,
      * ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපති,
      * බල ප්‍රදේශයේ විදුහල්පතිවරයෙක්,
      * බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩලයක නියෝජිතයෙක්,
   (ii) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නිල බලයෙන් කමිටුවේ සභාපති විය යුතු අතර කමිටුවේ සෑම රැස්වීමකටම ඔහු මූලාසනය දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයින් විසින් කමිටුවේ සාමාජිකයින් අතරින් තෝරාපත් කරගන්නා සාමාජිකයෙකු ඒ රැස්වීමෙහි මූලසානය දැරිය යුතුය,
   (iii) ප්‍රාදේශීය සභාවේ ලේකම් කමිටුවේ කැඳවුම්කරු විය යුතුය,
   (iv) ප්‍රාදේශීය සභා ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා කමිටුවේ ලේකම් විය යුතුය,
   (v) ගණ පූරණය සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් විය යුතුය,
   (vi) කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක් ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේය.

5. *සාමාජිකත්වය ලබා ගැනීම* :

(i) පුස්තකාල සේවාවන් අපේක්ෂාකරන සෑම තැනැත්තෙකුම සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන ගාස්තුවක් ගෙවා පුස්තකාලයාධිපති වෙතින් ලබා ගන්නා අයදුම්පතක් මගින් සාමාජිකත්වය ඉල්ලුම් කළ යුතු අතර, එම අයදුම්පත්‍රය පහත සඳහන් තැනැත්තෙකු ලවා සහතික කරවා ගත යුතු ය :–

* පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී,
* සමාදාන විනිශ්චයකාරවරයෙකු,
* ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු,
* රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු,
* පාසල් අයදුම්කරුවෙක් නම් එම අයදුම්කරුගේ පන්තිභාර ගුරුවරයා/විදුහල්පතිවරයාගේ සහතිකය.

(ii) පුස්තකාල සාමාජිකත්වය ලැබීම සඳහා පහත සුදුසුකම් තිබිය යුතුය :–

* සාමාන්‍ය සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකු හෝ දේපළ හිමියෙකු හෝ ස්ථිර රැකියාවක් කරන්නෙකු වීම,
* පාසල් සාමාජිකත්වය සඳහා වයස අවුරුදු 5 ට වැඩි බල ප්‍රදේශයේ පාසලක් හෝ පිරිවෙනක ඉගෙනුම ලබන්නෙකු විය යුතුය.

(iii) *සාමාජික ගාස්තු* :

වාර්ෂික සාමාජික ගාස්තුව සාමාන්‍ය සාමාජිකයෙකු සඳහා රු. 100කි. වසරකට වරක් රු. 30 ක් ගෙවා අලුත් කරවා ගත යුතුය.

පාසල් සාමාජිකයින් සඳහා සාමාජික ගාස්තුව රු. 50ක් හා වසරකට රු. 15ක් ගෙවා අලුත් කරවාගත යුතුය. එසේ වුව ද සාමාජික ගාස්තුව කමිටුවේ නිර්දේශය පරිදි සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලැබිය හැකිය. එසේම බැහැරදෙන අංශයට හැර විමර්ශන අංශය සහ අනෙකුත් අංශ පරිහරණය කිරීම සඳහා කමිටුවේ නිර්දේශය මත ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් පුස්තකාලයේ සාමාජිකයින් නොවන අයගෙන් අයකළ හැකිය.

(iv) *ඇපකරුවන්* :

* පාසල් සාමාජිකයින් සඳහා ඇපකරුවන් වශයෙන් ඔවුන්ගේ මව/පියා/භාරකරු/විදුහල්පති/පන්තිභාර ගුරුවරයා විය යුතුය.
* සාමාන්‍ය සාමාජිකයින් සඳහා ඇපකරුවන් වශයෙන් මාසික වැටුප් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියෙකු හෝ ප්‍රදේශයේ ප්‍රභූවරයෙකු/පවුලේ වෙනත් සාමාජිකයෙක්/බදු ගෙවන්නෙක් අත්සන් කළ යුතුය.

6. බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට නිකුත් කරන ලද බලපත්‍රයෙන් එක් වරකට පොත් 2 ක් ලබාගත හැකි අතර, සාමාජිකයා විසින් රැගෙන යන සෑම පොතක් සඳහාම ඔහු වගකිව යුතුය.

7. පුස්තකාල සාමාජිකයෙකු විසින් බැහැර ගෙන යන ලද යම් පොතක් එය ලබාගන්නා ලද දින සිට දින 14 ක කාලයක් ඇතුළත පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාරදිය යුතුය.

8. අතුරු ව්‍යවස්ථාවේ 7 වැනි ව්‍යවස්ථාවේ සඳහන් දින 14 ක කාලසීමාව ඇතුළත යම් පොතක් පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාරදීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හැරිනු ලැබූ අවස්ථාවක ඒ පොත ආපසු භාරදිය යුතු දිනය ඉක්මවා යන එක් දිනයක් වෙනුවෙන් රු.2 බැගින් හා පාසල් සාමාජිකයින් සඳහා රු. 1 බැගින් වන දඩ මුදලක් හෝ පුස්තකාල උපදේශක කමිටුවෙ නිර්දේශය මත සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන යම් මුදලක් දඩ වශයෙන් ගෙවීමට යටත් වන්නේය.

9. බැහැර ගෙන යන ලද පොතක් දින 14 ක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව දින 30 ක් ඇතුළත ආපසු භාර දීම සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ පොත නැති වූවාසේ සළකනු ලැබේ.

10. එසේ පොතක් නැතිවූයේ යැයි සැළකෙන අවස්ථාවක එම පොතේ වටිනාකම සහ එම පොතේ වටිනාකමින් 25% ක් දක්වා දෙපාර්තමේන්තු ගාස්තුවක් ද, අතුරු ව්‍යස්ථාවේ 8 ඡේදයේ සඳහන් දඩ මුදල් ද, අදාල සාමාජිකයා විසින් ගෙවිය යුතුය. සාමාජිකයා විසින් බැහැර ගෙන යන ලද පොතකට හානි කිරීම හෝ කවර ආකාරයකින් එය විරූප කිරීම හෝ නොකළ යුතුය.

11. බැහැර ගෙන යාමට අපේක්ෂා කරන පොතකට සිදු වී ඇති හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකම වන්නේය. එවැනි හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත සාමාජිකයාට හානියක් හෝ විරූප කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතුය.

12. සාමාජිකයෙකු විසින් ආපසු භාරදෙන ලද පොතක් නැවතත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඔහු විසින් හානිකර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත්වන්නා වූ අවස්ථාවක, ඒ පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව හානි වූ පොත ''හානි වූ පොතක් ලෙස විකුණන ලදී'' යනුවෙන් මුද්‍රා තබා ඒ සාමාජිකයාට දෙනු ලැබිය යුතුය.

13. * පුස්තකාලයෙන් ලබාගත් පොතක් කිසිම සාමාජිකයෙකු විසින් අන්සතු කිරීමක් නොකළ යුතුය.
* ඉහත 13 (1) අනු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

14. * ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කළ බව තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් ආපසු භාර නොදිය යුතුය.

* බැහැර ගෙන යන ලද පොතක් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන තැනැත්තෙකු විසින් පාවිච්චිකර ඇති විට ඒ පොත විනාශ කළ යුතු අතර, එය නැවත සපයා ගැනීමේ වියදම ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිවරයාට ගෙවිය යුතුය.

15. කිසියම් පොතක් ලබාදිය යුත්තේ කවර සාමාජිකයාට ද යන්න පිළිබඳව මත භේදයක් සාමාජිකයින් දෙදෙනෙකු හෝ වැඩිගණනක් අතර උද්ගත වූ විටෙක එම මතභේදය පුස්තකාලයාධිපති විසින් විසඳිය යුතුය.

16. බැහැර දෙන පොතක් කිසියම් සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටි විටක එය නිකුත් කළ යුතු අතර, ඒ වන විටත් එකී පොත නිකුත් කර තිබුණේ නම් ඉල්ලුම්කරුගේ හෝ ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයක සටහන් කරගෙන එම පොත පුස්තකාලයට ලැබුණු පසු ඒ ඒ තැනැත්තාට ලබාදීමට පුස්තකාලයාධිපතිවරයා ක්‍රියා කළ යුතුය.

17. බැහැර දෙන පුස්තකාලය ඉරිදා දින, ප්‍රසිද්ධ නිවාඩු දින හා යටත් පිරිසෙයින් සාමාජිකයින්ට දවස් 07 ක දැනුම් දීමකින් පසු තොග ගණන් ගැනීම සඳහා කමිටුව විසින් නියම කරන යම් දිනයන්හි හැර දිනපතා පෙ.ව. 9.00 සහ ප.ව. 5.00 අතර කාලය තුළ විවෘතව තබනු ලැබේ. නමුත් සභාවේ අභිමතය පරිදි පුස්තකාලය විවෘතව තබන වේලාවන් හා දිනයන් වෙනස් කරනු ලැබිය හැකිය.

18. *විමර්ශන අංශය* :

* පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ඇතිව විමර්ශන අංශයේ තබා ඇති ලේඛනයේ අත්සන් තබා විමර්ශන ග්‍රන්ථ පරිශීලනය කළ යුතුය.
* කියවීම සඳහා තමන් වෙත නිකුත් කරන ලද කිසිම පුස්තකාල පොතක්, සඟරාවක් හෝ වෙනයම් දෙයක් විමර්ශන අංශයෙන් පිටතට ගෙන නොයා යුතුය. එසේ වුව ද ඡායා පිටපත් සේවාවක් ක්‍රියාත්මක වන්නේ නම් පුස්තකාලයාධිපතිවරයාගේ අනුමැතිය හා භාරකාරීත්වය යටතේ එම ප්‍රකාශනයේ අවශ්‍ය පිටු නියමිත ගාස්තු ගෙවා ඡායා පිටපත් කර ලබා ගැනීමට ඉල්ලා සිටින යම් තැනැත්තෙකුට ඉඩකඩ සැලැස්විය යුතුය.

19. *කියවීම් ශාලාව* :

* සතියේ සෑම දිනකම පුස්තකාලයේ කියවීම් ශාලාව පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා හෝ සභාව විසින් තීරණය කරනු ලබන දිනයන් හා වේලාවන් තුළ විවෘත කර තබනු ලැබේ. කියවීම් ශාලාව පරිහරණය කිරීමට ඕනෑම තැනැත්තෙකුට හැකි අතර, ඒ සඳහා කියවීම් ශාලාවේ තබා ඇති ලේඛනයේ නම හා පැමිණි වේලාව සටහන් කර අත්සන් තබා කියවීම් ශාලාවේ සේවාවන් ප්‍රයෝජනයට ගත යුතුය.
* කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයත් කිසිම පුවත් පතක්, වාර ප්‍රකාශනයක්, සඟරාවක්, සිතියමක් හෝ වෙනත් පුස්තකාල ද්‍රව්‍යයකට හානියක් නොකළ යුතු අතර බැහැර ගෙන යාම ද නොකළ යුතුය.

20. *කිසියම් තැනැත්තෙකු* -

* මහජන පුස්තකාල පරිශ්‍රය තුළ හෝ අවට නොහික්මුණු ආකාරයේ හැසිරීම් හෝ එහි හිරිහැරයක් ඇති කිරීම නොකළ යුතුය,
* පුස්තකාලයේ හෝ ඒ අවට ප්‍රාදේශීය සභාවේ යම් ගොඩනැගිල්ලක කොටසකට හෝ යම් දේපළකට අලාභයක් කිරීම හෝ වෙනයම් ආකාරයකින් ඒවා විරූප කිරීම හෝ නොකළ යුතුය,
* පුස්තකාලය විවෘතව තබන වේලාවෙන් පසු එකී පුස්තකාල පරිශ්‍රය තුළ රැඳී සිටීම හෝ නිකරුනේ හැසිරීම නොකළ යුතුය,
* පුස්තකාල පරිශ්‍රය තුළ මත්පැන් පානය, දුම්බීම හෝ කෙළ ගැසීම නොකළ යුතුය,
* පුස්තකාල පරිශ්‍රය තුළ දාදු කැටවලින් හෝ කාඩ් කුට්ටම්වලින් සූදුවෙහි නොයෙදිය යුතුය,
* පුස්තකාල පරිශ්‍රය ඇතුළත ඝෝෂා කිරීමෙන්, ගී ගැයීමෙන්, වෙනත් ශබ්ද නැගීමෙන් හෝ ජංගම දුරකථන භාවිතයෙන් එම පුස්තකාලය පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය,
* අපිරිසිදු තත්වයකින් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය,
* පුස්තකාල පරිශ්‍රයට කිසිම සතෙකු ගෙන නොයා යුතුය,
* පුස්තකාල පරිශ්‍රය තුල නිදා ගැනීම හෝ යම් ආහාරයක් ගැනීම නොකළ යුතුය,
* පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලයාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තෙකුට මේ ව්‍යවස්ථාව යටතේ ඔහුගේ බලතල නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමෙහිලා බාධා නොකළ යුතුය.

21. යම් ආසාදන ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙලෙන හෝ මෑතක දී පෙලුණු නැතහොත් ඒ රෝගයකින් පෙලෙන තැනැත්තෙකුට මෑතක දී උපස්ථානයේ යෙදුණු කිසියම් තැනැත්තෙකු රෝග බෝවීමේ කාලය ඉකුත්වන තෙක් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම පිළිබඳව ඒ උල්ලංඝනය එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රු. 750 කට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විට නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම රු.50 කට නොවැඩි අතිරේක දඩයකින් යුත් දඬුවමක් සඳහා විධිවිධාන සැලැස්විය හැක.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා "සභාපති" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, "ලේකම්" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද, "පුස්තකාලයාධිපති" යන්නෙන් සබරගමු පළාත්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පුස්තකාල සේවාවට අයත් ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය භාරව කටයුතු කරන ප්‍රධාන නිලධාරියා හෝ එම තනතුරේ කටයුතු කිරීම සඳහා යොදවා ඇති වෙනත් ඕනෑම නිලධාරියෙකු අදහස් වේ.

"පුස්තකාල ද්‍රව්‍යයන්" යන්නෙන් ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය අදහස් කෙරේ.

24. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් අවස්ථාවක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවක් ඇති වුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකම බලාත්මක විය යුතුය.

08-229/1

---

**අයගම ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2010 ජුනි මස 30 වැනි දින,
සබරගමුව පළාතේ, පළාත් සභාවේ දී ය.

**රථ වාහන නතර කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රථවාහන නතර කිරීම පාලනය කිරීම හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෝටර් වාහන නවතා තැබීම පිණිස මෙහි මින් මතු පොදු නවතා තැබීමේ ස්ථාන යනුවෙන් සඳහන් කරනු ලබන ස්ථාන ලෙස අයගම ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ස්ථානයක් වෙන්කරනු ලැබිය හැකිය.

3. කිසිම තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් නොවන වෙනත් වාහනයක් නතර කර තැබීම නොකළ යුතුය.

4. මෙහි පහත දැක්වෙන පළමුවැනි, දෙවැනි, තුන්වැනි උපලේඛනවල දක්වා ඇති ප්‍රමාණයන් අනුව ගාස්තුවක් ගෙවා සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්නම් මිස කිසිම තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් නතර කර තැබීම නොකළ යුතුය.

5. 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක්ම ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද, ඒ මෝටර් වාහනයේ හඳුනා ගැනීමේ අංක ඇතුලත් විය යුතු අතර, අවසර පත්‍රයේ සඳහන් කාල සීමාව සඳහා වලංගු විය යුතුයි.

6. පොදු නවතා තැබීමේ ස්ථානයක නවතා තබනු ලැබූ යම් මෝටර් වාහනයක අයිතිකරු හෝ රියැදුරු විසින් ඒ වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස පොලිස් නිලධාරියෙකු, රථවාහන පාලකයෙකු හෝ තත්කාර්ය සඳහා සභාපති විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකු විසින් ඉල්ලනු ලැබූ කවර විටෙක හෝ ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

7. යම් පොදු නවතා තැබීමේ ස්ථානයක් යම් නියමිත පන්තියක හෝ වර්ගයක මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබූ අවස්ථාවක කිසිම තැනැත්තෙකු විසින් එම නවතා තැබීමේ ස්ථානයෙහි එකී පන්තියට හෝ වර්ගයට අයත් නොවන යම් මෝටර් වාහනයක් නවතා තැබීම නොකළ යුතුය.

8. පොදු නවතා තැබීමේ ස්ථානයකට ඇතුලු වන්නාවූ හෝ ඉන් පිට වන්නාවූ වෙනත් යම් වාහනයකට බාධාවන ආකාරයකින් කිසිම තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනය නවතා තැබීම නොකළ යුතුය.

9. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ මණ්ඩලයක් විසින් එකී ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාගත කරනු ලැබූ මණ්ඩලයකට හෝ නොලැබූ මණ්ඩලයකට අයත් මෝටර් වාහනයක් නවතා තැබීම සඳහා මෙහි උපලේඛනයෙහි සඳහන් ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් කළ හැකිය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව එක් එක් දවසේ පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා ක්‍රියාත්මකව පැවතිය යුතුය.

11. සභාපතිවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයකින් මෙම අතුරු ව්‍යවස්ථාව සතියේ කවර හෝ දවසක ක්‍රියාත්මක වීම අත්හිටුවනු ලැබිය හැකි අතර, මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි උපලේඛනයෙහි සඳහන් ගාස්තු ප්‍රමාණයන් ද වෙනස් කළ හැකිය.

12. 1. යම් තැනැත්තෙකු පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් නවතා ඇති අවස්ථාවක එම වාහනය සේදීම නොකළ යුතුය.

2. වාහනය අදාල ස්ථානයෙන් ඉවත් කර ගැනීමට අවශ්‍ය වන අලුත්වැඩියාවක් හැර අනෙකුත් අලුත්වැඩියාවක් නොකළ යුතුය.

13. මෝටර් වාහන නවතා තිබෙන ස්ථාන තුළ කිසිවෙකු විසින් විෂ මත්ද්‍රව්‍ය භාවිතය හෝ වෙළඳාම් කිරීම හෝ අනිසි ආකාරයෙන් හැසිරීම නොකළ යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වූ සෑම කඩකිරීමක්ම වරදක් වන අතර, නිසි අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබුවහොත් එකී තැනැත්තා එම වරද සම්බන්ධයෙන් රු. 750ට නොවැඩි දඩයකට යටත් වන්නේය. එම වරද ඉන්පසු දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව ද එම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රු. 250ක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවල :-
"සභාපතිවරයා" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස්වේ.
"සභාව" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාව අදහස්වේ.
"මෝටර් රථය, මෝටර් කෝච් රථය, මෝටර් සයිකලය, මෝටර් වාහනය, ලොරිය, බස් රථය, ට්‍රැක්ටරය සහ වාහනය" යන්නට (203 වන අධිකාරය) මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථයෙන්ම තිබිය යුතුය.
"රථ වාහන පාලක" යන්නෙන් පොදු නවතා තැබීම සඳහා, සභාව වෙනුවෙන් අවසරයක් නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ තැනැත්තෙකු අදහස්වේ.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථ නිරූපනයේ දී යම් අපැහැදිළි තැනක් වුවහොත්, සිංහල භාෂාවෙන් ඇති අතුරු ව්‍යවස්ථාව වලංගු වන්නේය.

සභාපති,
ප්‍රාදේශීය සභාව, අයගම.

*අංක 01 උපලේඛනය*

| | පළමුවන පැය හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව | පළමුවන පැයට වැඩි පැය 4ක් නොඉක්මවන සෑම අතිරේක පැය භාගයක්ම හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව | පැය 4ක් ඉක්මවන්නාවූ සෑම පැය භාගයක්ම හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| (අ) මෝටර් සයිකලයක් සඳහා | නැත | නැත | නැත |
| (ආ) මෝටර් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | 20 0 | 10 0 | 10 0 |
| (ඇ) ටේලරයක් සහිත ට්‍රැක්ටරයක් හෝ ලොරියක් සඳහා | 30 0 | 10 0 | 10 0 |
| (ඈ) ටේලරයක් රහිත ට්‍රැක්ටරයක් හෝ වෙනයම් වාහනයක් සඳහා | 20 0 | 10 0 | 10 0 |
| (ඉ) බස් රථයක් සඳහා | 30 0 | 10 0 | 10 0 |

*අංක 02 උපලේඛනය*

| | මසකට රු. ශ. |
|---|---|
| (අ) ත්‍රී රෝද රථයක් සඳහා මසකට | 150 0 |
| (ආ) කාර් රථයක් හෝ වෑන් රථයක් සඳහා මසකට - | |
| I ඩීසල් පාවිච්චි කරන වාහනයක් නම් | 200 0 |
| II පැට්‍රල්, ගෑස් පාවිච්චි කරන වාහනයක් නම් | 200 0 |
| III කුඩා ලොරියක් සඳහා මාසිකව | 250 0 |
| (ඇ) ටේලරයක් සහිත හෝ රහිත ට්‍රැක්ටරයක් සඳහා | 200 0 |
| (ඈ) බස් රථයක් සඳහා | 250 0 |

නගරය තුළ සිටින අයට නිරතුරුවම වාහන නවතා තැබීමේ ස්ථානයක් අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් ගාස්තු එකවර ගෙවීමෙන් වෙන්කර ගත හැකිය.

*අංක 03 උපලේඛනය*

| | මසකට ගාස්තු රු. | වසරකට ගාස්තු රු. |
|---|---|---|
| (අ) ටේලරයක් සහිත, රහිත ට්‍රැක්ටරයක් සඳහා | 200 | 2000 |
| (ආ) මෝටර් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | 250 | 2500 |
| (ඇ) ලොරියක් සඳහා | 200 | 2000 |
| (ඈ) මෝටර් සයිකලයක් සඳහා | නැත | නැත |
| (ඉ) බස් රථයක් සඳහා | 250 | 2500 |

*අංක 04 උපලේඛනය*

*වාහන නතර කර තැබීමේ ස්ථාන*

1. අයගම බස් නැවතුම් පොළ වෙළඳ සංකීර්ණය ඉදිරිපිට
2. අයගම බස්නැවතුම්පොළ ලීලෙ මහතාගේ කඩේ දෙපස
3. අයගම මානාන පාර දකුණු කෙළවර මහජන බැංකුව ඉදිරිපිට සිට පාළම දක්වා
4. අයගම සරත් මුත්තෙට්ටුවේගම පිළිරුව අසල
5. අයගම පන්සල අසල සිට පාළම දක්වා දකුණු පස
6. අයගම විමලදාස මහතාගේ කඩේ අසල වම් පස
7. අයගම ගයනා සැලූන් දෙසට ඉඩන්ගොඩ මාර්ගය
8. අයගම පන්සල අසල සිට සමුපකාරය දක්වා වම්පස
9. අයගම මෛත්‍රී මුදලාලිගේ කඩය අසල සිට දකුණු පස
10. අයගම රෝහල අසල
11. අයගම පොළ අසල සමෘද්ධි බැංකුව ඉදිරිපිට අඩි 300ක්
12. අයගම පාසල අසල සෝමපාල මහතාගේ කඩය ඉදිරිපස
13. ඇල්පෝරුව 1 කණුව අසල ධනපාල මහතාගේ නිවස අසල
14. මදනගොඩ සුමනාවතී මහත්මියගේ කඩේ ඉදිරිපිට දකුණු පස
15. උඩුගල ෆයින්හිල් වත්ත හන්දිය සුනිල් මහතාගේ කඩේ අසල
16. උඩුගල ඕකන්ද පාළම අසල වම්පස
17. පරගල හන්දිය ඒ. වී. ශෝෂන් මුදලාලි කඩේ ඉදිරිපස දකුණු කෙළවර
18. පිඹුර පාළම අසළ සිරිනන්දන කඩේ අසළ දකුණු පස
19. නිකගොඩ බටමණ්ඩිය හන්දිය බෝධිය අසළ
20. පල්ලේකඩ හන්දිය දයාවතී මහත්මියගේ කඩේ දෙපස වම්පස
21. තේ ජනපදය හන්දිය වම්පස
22. තේ ජනපදය හන්දිය දකුණු පස සුනිල් මහතාගේ කඩේ ඉදිරිපිට
23. තේ ජනපදයේ කළු මැදිරිය හන්දිය දකුණු පස.

08-229/3

---

**අයගම ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්තිය/126 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2010 ජූනි මස 30 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**වාහනවල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සහා මාර්ගවල ධාවනය වන වාහනවල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.
2. අයගම ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මාර්ග යනුවෙන් ප්‍රකාශයට පත්කොට ඇති හා වෙනත් අධිකාරියකට අයත් නොවන්නාවූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගවල බර වාහන ගමනාගමනය විධිමත් කිරීම පාලනය කිරීම, ධාවන වේගය හා බර සීමාවන් පැනවීම හා මාර්ගවලට වන හානිය අවම කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණවේ.
3. (i) මින් මතු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තු ගෙවා ලබා ගන්නා ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස ඉහත දෙවන ව්‍යවස්ථාවෙන් අර්ථ දැක්වෙන මාර්ගයක බර ටොන් 2 ට වඩා වැඩිවන්නාවූ ටිපර් රථයක්, ලොරිරථයක්, ට්‍රැක්ටරයක්, මාර්ග ඉදි කිරීමේ යන්ත්‍රයක්, ධාවනය කිරීම හෝ ගල් වැලි ආදී සියලු ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් ඛණිජ ද්‍රව්‍ය හෝ රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතුයි.

තව ද මෙම මාර්ගයක් මතින් සතුන් ලවා හෝ ට්‍රැක්ටරයක් මගින් දැව කඳන් හෝ වෙනත් ද්‍රව්‍ය ඇද්දවීම හෝ ඇදගෙන යාම නොකළ යුතුය.

(ii) වායුපීඩන ටයර් රහිත කිසිදු වාහනයක් වෙනත් වාහනයක පටවා මිස ප්‍රාදේශීය සභාවේ කිසිදු මාර්ගයක ධාවනය කිරීම නොකළ යුතුය.

4. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක ධාවනය කළ හැකි උපරිම වේග සීමාව පැයට කි. මී. 25ක් විය යුතුය.

5. (1) කිසියම් පුද්ගලයකු මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන ව්‍යවස්ථාවෙන් අර්ථ නිරූපනය වන මාර්ගයකින් කිසියම් ගොඩනැගිලි ද්‍රව්‍යයක්, කෘෂිකාර්මික නිෂ්පාදනයක් දැව හෝ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභාවේ සභාපතිවරයා වෙත යටත් පිරිසෙයින් දින 03කටවත් පෙර ඉදිරිපත් කළ යුතුය.

(2) ඉහත 5.1 අනු ව්‍යවස්ථාව අනුව ඉල්ලීමක් ලැබුණු කල්හි සභාපතිවරයා විසින් කාර්මික නිලධාරි හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවා නියමිත ගාස්තු හා හානි විය හැකි ප්‍රමාණය ප්‍රමාණවත් වන ඇප තැන්පත් මුදලක් ලබාගත යුතුය.

(3) ඉහත 5.2 අනු ව්‍යවස්ථාව යටතේ ඇප මුදල් හා නියමිත ගාස්තු අය කිරීමෙන් පසු ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව මිස අදාළ අවසරය ලබා නොදිය යුතුය.

(4) ඉහත 5.3 අනු ව්‍යවස්ථාව යටතේ ලබාගනු ලබන ඇප තැන්පතු මුදල නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමක් ලද විට ප්‍රථමයෙන් 10%ක දෙපාර්තමේන්තු ගාස්තු ද, අනතුරුව හානියක් වී ඇතොත් එකී අලාභයද තක්සේරු කර අයකර ගත යුතුය.

(5) හානිය, ඇප තැන්පතු මුදල, ඉක්මවා යයි නම් එම අතිරේක මුදලද ගෙවන ලෙස අදාල පුද්ගලයාට නියම කිරීම නිත්‍යානුකූල වේ. එසේම හිඟ මුදල් ගෙවන ලෙස නියම කර ඇති අවස්ථාවකදී ගෙවීම් පැහැර හරින්නේනම්, නිසි අධිකරණ බලය සහිත අධිකරණයක නඩු පවරා හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේය.

6. ප්‍රාදේශීය සභාව සමග සංවර්ධන කටයුතුවලට අදාල ගිවිසුම්වලට එළඹී ඇති කොන්ත්‍රාත්කරුවන් විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීම් මගින් මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ගාස්තුවලින් නිදහස් කර ගත හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම පරීක්ෂා කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔවුන් විසින් බලය පවරන වෙනත් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩකිරීමක් ම වරදක් වන අතර, කිසියම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට රු. 750කට නොවැඩි දඩයකින් ද, වරදකරු කිරීමෙන් පසුවද එම කඩකිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයිනම් එකී කඩකිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔවුන් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුවද ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රු. 250ක් නොඉක්මවන අතිරේක දඩයකට යටත් විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් ව්‍යවස්ථාවක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇති වුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකම බලාත්මක විය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ විෂය වන්නාවූ ඕනෑම කරුණක් වරින්වර සංශෝධනය කරගැනීමේ බලය ප්‍රාදේශීය සභාව සතු වන්නේය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා "ප්‍රාදේශීය සභාව" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවද, "සභාපතිවරයා" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, "ලේකම්" යන්නෙන් අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද, වෙනත් බලය පවරන ලද නිලධාරියෙකු යන්නෙන් ප්‍රාදේශීය සභාවේ වෙනත් නිලධාරියෙකු ද, ග්‍රාම නිලධාරියෙකු ද, පොලිස් නිලධාරියෙකු ද අදහස් වේ.

### *පළමු වන උපලේඛනය*

1. වැලි, පස් සහ වෙනත් ඛණිජ ද්‍රව්‍ය ප්‍රවාහනය එක් වාරයකදී කියුබ් -

| | |
|---|---|
| 1/2ක් සඳහා | රු. 25 0 |
| 1ක් සඳහා | රු. 50 0 |
| 2ක් සඳහා | රු. 100 0 |
| 3ක් සඳහා | රු. 150 0 |
| 3ට වඩා වැඩි වන සෑම කියුබ් එකක් ද සඳහා රු. 10 බැගින් | |

2. දර උණ දඬු හා දැව කඳන් ප්‍රවාහනය -

| | |
|---|---|
| ට්‍රැක්ටරයක් සඳහා එක් ගමන් වරකට | රු. 200 0 |
| ලොරි, ටිපර්, ට්‍රක් රථයක් එක් ගමන් වාරයකට | රු. 300 0 |
| ඇතුන් ලවා දැව කඳන් ඇද්දවීම එක් දිනකට | රු. 500 0 බැගින් |
| ඉදිකිරීම් වෙනත් යන්ත්‍ර (චේන් ලෝඩර්ස් නොවන) දිනකට | රු. 1,000 0 |

3. කෘෂිකාර්මික ද්‍රව්‍ය ප්‍රවාහනය -

| | |
|---|---|
| නිතිපතා හෝ මසකට දින 05කට වැඩි | රු. 200 0 |
| නිතිපතා නොවන හෝ දින 05කට වැඩි නොවන | රු. 100 0 |

08-229/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.